**ශීර්ෂය - 10 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 10 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **මෙම වාර්තාවේ ඡේදයට යොමුව** |
|---|---|
| ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයන්හි ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී වෙනස්කම් පැවතීම. | 1.6.1 (ආ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු.6,429,201 ක්වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් යටතේ දක්වා නොතිබුණු අතර පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |

## (ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.169,483 ක්වූ විදුලි යාන්ත්‍රික මෙවලම් ඒසීඒ 6, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයේ මිලදී ගැනීම් ලෙස සටහන් නොකර සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට එකතු කර දක්වා තිබුණි.මේ නිසා මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයට සමානවී නොතිබුණි. | මෙය 2001 වැය විෂයය යටතේ මිලදීගෙන ඇති අතර එම වැය විෂයය යටතේ කරනු ලබන මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කිරීමට CIGAS වැඩසටහන යටතේ පහසුකම් නොමැති බැවින් එය ආරම්භක ශේෂයට එකතු කරන ලදී. එලෙස කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අවසරය ලබාදී ඇත. | වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දැක්විය යුතු අතර මිලදී ගැනීම් වෙනම සටහන් කළ යුතු වේ. |

## (ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාව විසින් සකස් කර තිබූ වාහන අනතුරු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 2003, 2016 හා 2022 වර්ෂවල සිදුවූ අනතුරු හතරකට අදාල පාඩුව පොත් වලින් කපාහැර ලේඛණය යාවත් කාලීන කිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | වාහන අනතුරු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අල්ලස් වැටලීම්වල - අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.193,900 ක අත්තිකාරම් සම්බන්ධව නඩු තීන්දු ප්‍රකාශයට පත්කර තිබුණද විගණිත දිනය වන 2023 ජුනි 14 දින වන විටත් එම අත්තිකාරම් මුදල් සරප් වෙත නිරවුල් කර නොතිබුණි. | රු.23,800 ක් අධිකරණ භාරයේ ඇත. ඉතිරි රු.170,100 කට අදාල නඩු ගොනු නිරවුල් කිරීමට අදාල කටයුතු කරමින් පවතී. | නඩු කටයුතු හා අභියාචනා අවසන් වූ විගස අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1954 අංක 11 දරන අල්ලස් පනතේ 30 (අ) (3) වගන්තිය ප්‍රකාරව වැටලීම්වලට යොදා ගන්නා මුදල් නෝට්ටු සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේදී සහතිකයක් නිකුත් කරනු ලබන බැවින් හැකි සෑම විටම සහතිකයක් අධිකරණයට ඉදිරිපත් කළ හැකි වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.39,716,535 ක රජයේ මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුණි. | 23.06.21 දින පැවැත්වීමට නියමිත කොමිෂන් සභා රැස්වීමට මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා යොමු කර ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 03 ක රු.740,814 ක්වූ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.222,033 ක බැරකම්වලට එළඹ තිබුණි. | වෙනත් වැය විෂයන්හි ඉතිරිවීම් පවතින බැවින් මු.රෙ.66 යටතේ මාරු කිරීමට ප්‍රතිපාදන සලසා ඇති බැවින් මෙම බැඳීම් වලට එළඹී ඇත. | ප්‍රතිපාදන නොඉක්මවා බැරකම්වලට එළඹිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය, ඇමුණුම - (iv) හි වාර්ෂික පුනරාවර්තන සේවාවන්, සැපයුම් හා විලම්භිත බැරකම් දැක්විය යුතු වුවත්, ඒ යටතට නොගැනෙන ගමන් වියදම්, අතිකාල වියදම් හා ඉන්ධන වලට අදාල රු.564,851 ක්වූ බැරකම් එම ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් හා බැරකම් පමණක් ඇමුණුම (iv) හි දැක්විය යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කොමිෂන් සභා පනත අනුව මෙම වාර්තාව නියමිත කාලය තුල ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. අවශ්‍ය නම් ඉදිරි වර්ෂවලදී පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හැකිය. | ජාතික විගණන පනත ප්‍රකාරව කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| **(ආ)** | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 11.1.6 වගන්තිය | සෑම මුදල් වර්ෂයකම මාර්තු 15 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් රජයේ ආයතනනවලට පැවරිය හැකි භාණ්ඩ | සුළු ප්‍රමාදයක් සිදුව ඇති අතර ඉදිරි වසර වලදී නියමිත කාලයට සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය අනුව කටයුතු කර වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර මාර්තු 31 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | | |
| **(ඇ)** | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව නොතිබුණි. | 2022 වසරේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කාර්තු ක්‍රමයට සකස් කර තිබූ අතර 2023 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අදාල ආකෘතියට අනුව සකසා ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 2.2 ඡේදය | ආයතනයට අදාල වන මූල්‍ය වාර්තාකරණ ආකෘති පමණක් භාවිතා කළ යුතු වුවද, ආදායම් ගණන්දීමේ නිලධාරීන් පමණක් භාවිතා කළ යුතු ඒසීඒ 1, ඒසීඒ 1 (ii), ඒසීඒ 1(iii) ආකෘතීන්වල, කොමිෂන් සභාව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් එකතුකල ආදායම් දක්වා මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර තිබුණි. | ඉදිරි වර්ෂවල අවසාන ගිණුම් සකස් කිරීමේදී එම ආකෘති පත්‍ර නොදැක්වීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. | ආදායම් ගණන්දීමේ නිලධාරීන් පමණක් සකස් කළ යුතු ආකෘති පත්‍ර කොමිෂන් සභාවට අදාල කර නොගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේදී නඩු 69 ක් අවසන් කර තිබුණු අතර ඉන් නඩු 40 ක් එනම් සියයට 58 ක් නඩුව ඉල්ලා අස් කර ගැනීම් විය. නඩු 18 ක වූදිතයින් නිවැරදිකරු වී තිබුණු අතර වරදකරු වි තිබුණේ නඩු 11 ක වූදිතයින් පමණි. 2022 වර්ෂයේදී නඩු 89 ක් පවරා ඉන් නඩු 45 ක් විවිධ හේතූන් මත ඉල්ලා අස් කරගෙන තිබුණි. විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 19 දින වන විට නැවත නඩු පවරා තිබුණේ ඉන් නඩු 20 කට පමණි. | 2022 වසරේ ඉල්ලා අස්කර ගත් නඩු වලින් 20 කට නැවත නඩු පවරා ඇත. 09 කට නඩු නොපැවරීමට තීරණය කර ඇත. 14 ක් සඳහා නඩු පැවරීමට කටයුතු කරමින් සිටී. ඉතිරි 2 හි සාක්ෂිවල පරස්පරතා පවතින බැවින් නඩු පැවරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී. | ඉල්ලා අස්කර ගත් නඩු සම්බන්ධයෙන් කඩිනමින් නැවත නඩු පැවරීම හෝ වෙනත් සුදුසු කටයුත්තක් කළ යුතු වේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ නීති අංශය සතුව වැඩ අවසන් නොකළ ලිපිගොනු 1,508 ක් පැවතුණි. ඉන් ලිපිගොනු 489 ක් වසර 05 ට වැඩි කාලයකටද ලිපිගොනු 33 ක් වසර 10 කට අධික කාලයක සිට පැවති ලිපිගොනු විය. 2022 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොකල ලිපිගොනු 926 ක් පැවති අතර එහි කාලවිශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොවිය. | වැඩ අවසන් නොකල ගොනු 926 අතර ඉතා සංකීර්ණ හා විශාල ලේඛණ ප්‍රමාණයක් පරිශීලනය කලයුතු ගොනු හා සරල හා කෙටි කාලයකින් නීති වාර්තා සැපයිය හැකි ගොනු වේ. මේ නිසා නිශ්චිත කාල විශ්ලේශණයක් ඉදිරිපත් කළ නොහැක. | ලිපිගොනුවල වැඩ අවසන් කර කාර්යසාධනය ඉහල නංවා ගතයුතු අතර ලිපිගොනුවල කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට හැකිවිය යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මට 2019 පෙබරවාරි 5 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු | කොවිඩ් වසංගත තත්වය මත අදාල කාර්යයන් ප්‍රමාදවූ අතර 2023 වසරේදී ඉතිරි කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නොපමාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | අතර 2019 මාර්තු 18 වැනි දින එහි කටයුතු ආරම්භ කර තිබුණි. විගණන දිනය වූ 2022 දෙසැම්බර් 20 වන විටත් එම සැලැස්ම ආරම්භ කර අවු. 3 ½ ක් පමණ ගතවී තිබුණද එහි සඳහන් කාර්යයන් 27 න් කාර්යයන් 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | |

**3.2 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.639,843 ක්වූ හානි හා පාඩු ශේෂ 08 කින් 2003, 2016 හා 2022 වර්ෂවල සිදුවී තිබූ එකතුව රු.544,293 ක්වූ අනතුරු 04 ක් සම්බන්ධයෙන් 2023 මැයි 22 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | 2003, 2016 සහ 2022 වර්ෂවල සිදුවූ අනතුරු 04 ක් හැර ඉතිරි සියල්ල පොත් වලින් කපාහැරීමට කටයුතු කර ඇති අතර මෙම අනතුරු හතරට අදාල පාඩුවද පොත් වලින් කපාහැරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව අයකර ගැනීමට හෝ සුදුසු පියවරක් ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ සැලසුම් කර තිබූ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී හෝ අවසන් කර නොතිබුණි. | අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභා සංශෝධන පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා මේවන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. | පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2006 ජනවාරි 31 දින නඩු භාණ්ඩ අපහරණය කිරීම පිළිබඳව පත්කර තිබූ කමිටුව මගින් ගොනු 10 කට අදාල නඩු භාණ්ඩ අයිතම 36 ක් වෙන්දේසියට යොමු කිරීමටත්, ගොනු 27 කට අදාල භාණ්ඩ අයිතම 32 ක් අපහරණය කිරීමටත් නිර්දේශ කර තිබුණු අතර එම නිර්දේශ ලබාදී වසර 17 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023.06.21 දින පැවැත්වීමට නියමිත කොමිෂන් සභා රැස්වීමට මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා යොමු කර ඇත. | නඩු භාණ්ඩ අපහරණය කිරීම පිළිබඳව පත්කර තිබූ කමිටුවේ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොමිෂන් සභාවේ සිවිල් කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 36 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 203 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 158 ක්ද හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 56 ක්ද පැවතුණි. විමර්ශණ කාර්ය මණ්ඩල තොරතුරු අනුව එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවතුණි. | 2022 වර්ෂයේ සිට රජයේ සේවක බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි විය. 2022 අග පැවති කාර්ය මණ්ඩල සමායෝජන අනුකමිටු වාර්තාව අනුව බොහෝ තනතුරු යටපත්කර ඇත. අනුමත තනතුරු කිහිපයක් සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කරමින් සිටි. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |